ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

Phone **: 02074289388**
Fax **: 08719005163**
E-mail **: lanka.viththi @ virgin.net**

කර්තෘ : *දයා ආනන්ද රණසිංහ*
Editor **: Daya Ananda Ranasinghe**
චිත්‍ර : **චන්දන සෙනෙවිරත්න**
Art : Chandana Seneviratna
පරිගණක කටයුතු : **චන්න කබ්රාල්**
Computer Graphics : Channa Cabraal
ඡායාරූප : **ආනන්ද කාරියවසම්**
Photography : Ananda Kariyawasam



සිංහලයින්ට බුදු දහම අවශ්‍යද?

බුදුහාමුදුරුවන් පිරිනිවන් පා මේ වෙසක් පෝයට හරියටම අවුරුදු 2555 ක් සම්පූර්ණ වෙයි. මිහිඳු මහ රහතන් වහන්සේ බුද්ධ ධර්මය රුගෙන ශ්‍රී ලංකාවට ආවේ බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසුව ය. ගණන හදා බැලූ විට ශ්‍රී ලංකාවට බුද්ධාගම ලැබී දැන් අවුරුදු 2319 ක් වෙයි.

අප රටවාසීන් දැන හැඳිනගත් මුල්ම ආගම බුද්ධාගම ය. ඊට පෙර අප රටේ ආගමක් තිබුණු බවට සළකුණක් නැත. මිහිඳු හාමුදුරුවන් ලංකාවට වඩින විට එහි වූයේ ගස් ගල් ඉර හඳ තාරකා වලට වන්දනා මාන කරන ඇදැහිලි ක්‍රමයකි. බුද්ධ ධර්මය ස්ථාපනය වීමට එවකට ලංකාවේ රජ කළ දේවානම්පිය තිස්ස රජතුමාගේ පූර්ණ අනුග්‍රහය ලැබුණි. සඟ සසුන ද ඇතිවිය. එවක් පටන් අප රට සිංහල බෞද්ධ රටක් වශයෙන් හැඳින්වෙන්නට විය. පර සතුරු ආක්‍රමණ කොතරම් ආවත් සිංහල බෞද්ධත්වය අප රටෙන් නැතිවී ගියේ නැත.

වසර 2314 ක ඉහතදී ලත් බුදුදහමේ ආභාෂය නිසා නිවහල් චින්තන ධාරාවක් අප ජනතාව තුළට කාවැදුණු බව ඇත්තකි. ඒ දවස සිට ඉදිරියට මේ වර්තමානය වන තුරා අප රටේ බහුතර ජනතාව කරුණාව මෛත්‍රිය පෙරදැරිව, පස් පවෙන් වැළකී යහපත් මනුෂ්‍යයින් ලෙස ජීවත් වූහ. ඒ බව අපේ ඉතිහාසයෙන් ද, ලංකාවට ආ විදේශිකයින් ආපසු ගොස් ලියා තැබූ විස්තර වලින් ද මනාව පෙනී යයි. අද තත්වය එසේ නොවේ.

අද සිංහල සමාජය ඉතා පහත් දිනතත්වයකට පත් වී පිරිහීමේ අන්ත පතුලටම වැටී සිටී. දුරාචාරය ඉහ වහා ගොසිනි. හොරකම්, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර හා මිනිමැරුම් ගතවන සෑම තත්පරයක් පාසා සිදුවේ. සුරාව හා මත්කුඩු අහස උසට ය. පගාව අල්ලස ගැන කතා කර වැඩක් නැත. වයස්ගත කාන්තාවකට හෝ තරුණියකට හෝ කුඩා ගැහැණු ළමයෙකුට බස්රථයක යා නොහැක. මැස්සන් මෙන් වටවන වනචරයෝ ඇඟ අතගාති. තාත්තා දුව ද, අම්මා පුතා ද දූෂණය කරති. ඒවා අගය කර චිත්‍රපට කතා ලියති. ඒවාට සම්මානත් ලැබේ. ශ්‍රීලංකා සිංහල සමාජයේ අද හැටි අද තත්වය ඔන්න ඔය ආකාර ය.

දැන් ප්‍රශ්නය මෙයයි. අවුරුදු දෙදහස් දහනමයක් බුද්ධාගම ඇදහූ සමාජයක් මෙසේ වූයේ ඇයිද කියායි. එයට පිළිතුර- එය බුද්ධාගමේ වරද නොවේ යන්නය. බුද්ධාගම හැර වෙන මොන ආගම ඇදහූවත් සිංහලයා මේ විදියමය. මක්නිසාද ඔහුට බුද්ධියක් මොළයක් නැති බැවිනි. හොඳ නරක හඳුනා ගන්නට ඔහුට නොහැකිය. ඔහු දින දින පිරිහීමේ පතුළටම යන්නේ ඒ නිසාය. සිංහලයාට බුදුදහමේ වටිනාකමක් නැත. මෙතෙක් කල් ඔහු එය ඇදහුවේ බොරුවට ය. ඔහුට එක ආගමක් මදිය. ඔහු හැම ආගම ම ඔලුවේ නවා ගනී. පන්සල් ගිහින් එන ගමන් කෝවිලටත් යයි. පල්ලියටත් යයි. සායිබබා බලන්නටත් යයි. තමාගේ විමුක්තිය කොහිදැයි ඔහු නොදනී. නිවන් යනවාද සුවර්ගයට යනවාද, නැත්නම් වෙනකොහේ හරි යනවාද කියා සිංහලයා ට හරි අරමුණක් නැත. ඔහුට කොහේ හෝ කමක් නැත. කන්න බොන්න ලැබෙනවා නම් ඕනෑම බස් එකක ඔහු නගී. මගදී බසී. තව එකක නගී. සංසාර ගමන ඔහුට ජොලි වන්දනා ට්‍රිප් එකකි.

බුදු දහමේ වටිනාකම අවබෝධ කරගත් බටහිර ලෝකය අද එය සිළුයෙන් හදවතින් ම වැළඳගනිද්දි ලංකාවේ සිංහලයා බුදු දහම ගැන දොයිතුවක තැකීමක් නොකර නිදන්වස්තු හාරන්නේ, බුදු පිළිම බෝතල්කාරයාට විකුණන්නේ ඔහුට බුද්ධාගමෙන් වැඩක් නැති බැවිනි. ගොනාගේ ඇඟපත වැඩි මහත්වුනාට මොළය වැඩෙන්නේ නැතැයි බුදු වදනක් ධම්මපදයේ ගාථාවක ඇත. බුදුහාමුදුරුවන් එය දෙසුවේ අද සිංහල තකතිරුවන් ගැන එදා උන්වහන්සේ දිවැසින් දුටු නිසා විය යුතු ය.

දකින්න බැරි නිවන

මමය මාගේය කියන හැඟීම ගෙනදෙන සක්කාය දිට්ඨිය නැතිවූ විට නිවන් මගට පිවිසෙන දාරටුව විවෘතවේ. නිවන තමා බවටත්, තමා නිවන බවටත් පත්වේ. ඒ තත්ව යට ආ හැක්කේ ඉතා සංවේදී පුද්ගලයන්ට පමණය.

බොහෝ බෞද්ධයන් පින් කරන්නෙ යම් දිනක නිවන් දකින්නත් හිතාගෙනයි. එහෙම හිතන්නෙ නිවන කියන්නෙ මොකක්ද කියලවත් හරිහැටි නොදනයි. ඒ වගෙම නිවන කියන්නෙ තමා තුළම තියෙන ධර්මයක් මිසක, තමාගෙන් පිටත තියෙන බාහිර ධර්මයක් නොවන බවත් නොදනයි. එම නිවන සාක්ෂාත් වෙන ධර්මයක් මිසක දකින්න හැකි ධර්මයක් නොවෙයි. නිවන එසේ සාක්ෂාත් වෙන්නෙ නිවන තමා බවටත්, තමා නිවන බවටත් පත්වෙලයි. එහෙම වෙන්නෙ නිවන තමන්ට පත්තියං වෙලයි. නිවන එසේ පත්තියං වෙන්නෙ ඉතාමත්ම සංවේදී පුද්ගලයන්ට පමණක් බවයි පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි කියන ධර්ම පාඨයෙ අදහස.

අප කන-බොන ආහාර-පාන අපට පත්තියං උනාම ඒවායේ ආහාර ස්වරූපය වෙනස් වෙලා, ඒවා අප නොහොත් අපේ ලේ බවට පත් වෙනවා වගෙයි, නිවනත් අපට පත්තියං වෙන්නෙ. ඒ වුනාට නිවන එසේ පත්තියං වුනාම මමය මාගේය කියන හැඟීම ගෙනදෙන සක්කාය දිට්ඨියයි කියන මතය නමැති පිළිගැනීමත් නැතිවෙලා සදාතන නිවන පමණක් ඉතිරි වෙනවා.

විශුද්ධි මාර්ගය ලියන බුද්ධඝෝෂ හාමුදුරුවො අත්ථි නිබ්බුති න නිබ්බුතො කියල ලිව්වෙ, නිවනක් තිබුණට නිවන් දක්ක කෙනෙක් දකින්න නැහැ කියන්නෙ ඒකයි. ඊට හේතුව මම ය මාගේය කියන හැඟීම ගෙන දෙන සක්කාය දිට්ඨිය නිවන් මගේ ස්ථිර මුල් පියවර වන සෝවාන් පලයෙදිම නැතිවී මයි. ඊට පස්සෙ නිවන් දකින මාර්ග යක් තිබුණට, ඒ මාර්ගයේ ගමන් කරන කෙනෙකු දක්නට නැති බවයි මග්ගමත්ථි ගම්කො න විජ්ජති කියා බුද්ධඝෝෂ හිමියන් වදාරන්නෙ. ඒ නිසයි සක්කාය දිට්ඨිය නැතිවීමෙන් පසු, යළි නොවරදින ලෙස ඇරඹෙන එම මාර්ගය අවසානයෙදි නිවන් දකින කෙනෙකුත් නැති වෙන්නෙ. මම ය මාගේ ය කිය හැකි කෙනෙක් ඉන්නව කියන හැඟීම තියාගෙන කවදාක්වත් නිවන් දකින්න බැහැ. බුදු දහමෙන් කියවෙන පරම සත්‍යය අනුව මමය මාගේය කියා කෙනෙක් ඇත යන්න මායාකාර මතයක් පමණයි. ඇත්ත වශයෙන්ම මම යනු හැම ක්ෂණයකදීම වෙනස් වෙවී යන ගතික ශක්ති ප්‍රවාහයක් පමණයි. කිසිම අවස්ථා දෙකකදී ඒ අනිත්‍ය ශක්ති ප්‍රවාහයට එකම ස්වරූපයකින් ඉන්න බැහැ. බාහිරව එහි පෙනෙන ස්ථාවර ස්වරූපය මායාවක් පමණයි. භෞතික වශයෙන් පොඩි කාලෙ හිටිය අපම නොවෙයි දැනුත් ඉන්නෙ. බුදු හිමියනුත් බුදු වීමෙන් පසු ගතවුණු අවුරුදු 45 තුළ එකම භෞතික ස්වරූපයෙන් හිටියෙ නැහැ. උන්වහන්සෙත් ටිකෙන්ටික ජරාවට හා ව්‍යාධියට භාජනය වුනේ අනිත්‍යතා න්‍යාය අනුව උන්වහන්සේගෙ භෞතික ස්වරූපය හැම තිස්සෙම වෙනස් වෙමින් තිබුණු නිසයි. ඒ වුනත් සනාතන නිර්වාණ ධර්මය පාදක කරගත්ත බුද්ධත්වය ඒ කාලය තුළ කිසිම වෙනසකට භාජනය වුනේ නැහැ. ඒ බුද්ධත්වය ඇතිවෙන දෙයක්වත් නැතිවෙන දෙයක්වත් නොවෙයි. මතුවෙන දෙයක්. නිවන් දකල බුදු වෙච්ච බුදුකෙනෙකුන් අවුරුදු 45 ක් වැඩ හිටියා කියල අප හිතාගෙන හිටියට, ඇත්ත වශයෙන්ම බුදුන් යනු නිවන් දහම බවයි යො ධම්මං පස්සති සො මං පස්සති කියල වක්කලි හිමියන්ට කරන ලද බුද්ධානුශාසනාවෙන් කියවෙන්නෙ. ඒ අනුව නිවන මූර්තිමත් වෙන බුද්ධත්වයක් මිසක බුද්ධ ආත්මයක් නැහැ. බුදුදහම අනාත්ම වාදයක්. නිවනක් තිබුණට නිවන් දකින ආත්මයක් නොහොත් පුද්ගලයකු නැත්තෙ ඒකයි. ඒ නිසා නිවන දකිය හැක්කක් නොවෙයි.

♦ ***සම්මානිත මහාචාර්ය***
ටී. එස්. අබේවික්‍රම
Harrow UK

❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

හිතෝපදේශයෙන්

යද්‍යනර්ථෙෂු සාමාර්ත්‍යය - මර්තෙඋෂ්වපි ච විද්‍යතෙ
හස්තස්ථං න භවෙතකස්‍ය - සර්වියම් සෞගතම් පදම්

අර්ථය : *අවැඩ කිරීමෙහි පොහොසත් බව ඉදින් වැඩකිරීමෙහිත් වේ නම් සියළු සත්වයන්ට හිතවූ සර්වඥ පදවිය කවරෙකු හට අත්පත් නොවන්නේද? වන්නේමය!*

බොහෝ දෙන වැඩකිරීමට වඩා අවැඩ කිරීමට දක්ෂයෝ වෙති. තම තීක්ෂණ බුද්ධිය හා විවිධ ක්‍රමෝපායන් භාවිතාකරමින් ඔවුහු තමනට අවැඩ සිදුකරගන්නා අතර අන් අයටද අවැඩ පමුණුවති. ධනය, බලය සහ තම තරාතිරම ගොඩ නගා ගැන්මට හා ඒවා ආරක්ෂාකරගැන්ම පරමාර්ථකොට ගනිමින් මෙම අවැඩ සිදුකරති. භෞතික සැපසම්පත් ළඟාකරගැනීම හා එමගින් පසිඳුරන් පිනවීම ජීවිතයේ එකම අරමුණ ලෙස සලකන අය අතින් මෙම විපත බොහෝ විට සමාජයට සිදුවේ.

නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් කෙනෙක් අන් අයගේ සුව පහසුව සඳහා යාන වාහන පහසුකම්ද, පරිගණකය, දුරකථනය, රූපවාහිනිය ආදී නවීන තාක්ෂණික මෙවලම් මගින් ජනතාවගේ ආශාවන් වර්ධනය කරමින් අධ්‍යාත්මික ගුණධර්ම මොටකරමින් සපයන අශ්ලීල විනෝදා ස්වාදය සහ විවිධ ක්‍රියාදාමයන්ද, තවත් කෙනෙක් ජීවී අජීවී සියල්ල සැණකින් සුණු විසුණු කරන න්‍යෂ්ටික අවි ආයුධ නිපදවීම සඳහාද පෙළගැසී සිටිති. එක් අතකට මුලින්ම සඳහන් කළ දේවල උපයෝගීතාව මිනිසාගේ පහසුව සඳහා පිහිටවන අතර ඒ සමගම ඔහුගේ හැදියාව, ආගම දහම හා ශීලාචාරකම ද විනාශකර දමනු ලබන්නේ ය.

අප සමාජයේ සිටින සොරුන්, මංකොල්ලකරුවන්, මිනීමරුවන් හා මත්කුඩු ජාවාරම්කරුවන් වැන්නන් ඔවුන්ගේ හැකියාවන් හා ශක්තිය හොඳ වැඩකට යොදවන්නේ නම් ඔවුන් විද්‍යාඥයින්, ඉන්ජිනේරුවන්, වෛද්‍යවරුන්, කාර්මිකයින් වැනි සමාජයට සෙත සලසන්නන් විය හැකිය. බුදුන් දවස සිටි දෙවිදත් තෙරුන් බොහෝ හැකියාවන්ගෙන් පිරුණු කෙනෙකි. සෘධියෙන් පවා යාහැකි තත්වයට දියුණු වූ කෙනෙකු වීය. නමුත් අජාසත් සමග එකතුව තම යහපත් ජීවිතය සම්පූර්ණයෙන් දුක්ඛිත එකක් බවට හරවා ගත්තේය. බල තණ්හාවෙන් අන්ධ වූ ඒ තෙරුන් සංඝ සමාජයටද, තමාටද, බාහිර සමාජයටද විශාල විනාශයක් සිදුකළේය.

අංගුලිමාල තෙරුන්ද බෞද්ධ සාහිත්‍යයේ එන මේ සඳහා වන කදිම නිදසුනකි. විනීත ශිෂ්‍යයෙකු වූ අහිංසක ගුරු භක්තියෙන් පිරී ඉති දක්ෂයකු වීය. නමුත් ඊර්ෂ්‍යාව වැනි සමාජයෙන් එල්ලවූ බලපෑම් නිසා ඔහුගේ හැකියාවන් යටපත්වී ඔහු භයානක මිනීමරුවෙකු බවට පත්විය. අවසන බුදුරජාණන් වහන්සේගේ මහාකරුණාව නිසාම යළි උතුම් පුද්ගලයෙකු බවට පරිවර්තනය වන්නට ඔහුගේ හැකියාවන් උපකාරී වීය.

බුද්ධර්මයට අනුව සත්ව හිංසාව වෙනුවට කරුණාව, මෛත්‍රිය හා දයානුකම්පාව ද, තණ්හාව, ලෝභය හා මසුරුකම වෙනුවට පරිත්‍යාගශීලීබව හා අනුන්ට උදව් උපකාර කිරීම ද, වෛරය, ඊර්ෂ්‍යාව හා ක්‍රෝධය වෙනුවට මෛත්‍රිය, උපේක්ෂාව හා ඉවසීම වැනි ගුණධර්මද වර්ධනය කරගැන්ම ඉතා වැදගත් ය. තම හැකියාව හා බලය යොදවා සෙස්සන් ට වංචාකිරීමෙන්ද, රැවටීමෙන් හා මුලාකිරීමෙන් ද, ඔවුන්ගේ සැපසම්පත් භුක්තිවිඳීමද, ඔවුන්ගේ ශ්‍රමය අසාධාරණ ලෙස ලබාගැනීම ද සමාජ සමානාතමතාවයට කරන නිග්‍රහයකි.

ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකුගේ උතුම් ප්‍රාර්ථනාවන් තමාටත් සමාජයටත් අර්ථයක්ම සලසන බව කොසොල් මහ රජුගේ ප්‍රාර්ථනා පහෙන් පැහැදිලිවේ. බුදුරජාණන් වහන්සේ හමුවී විමුක්තිය ලබාගැන්මෙන් පසු උන්වහන්සේ ඒවා පහදා දුන්හ. **1.** මගධයේ මහරජු වීම. **2.** මේ ජීවිතයේදී විමුක්තිය අවබෝධ කළ ගුරුවරයෙකු මුණගැසීම. **3.** එබඳු ගුරුවරයෙකුට තම ගෞරවය පෙන්වීමට හැකිවීම. **4.** එම ගුරුවරයා විසින් මා හට සත්‍යය පෙන්වනු ඇතැයි යන්න. **5.** එම ගුරුවරයාගේ ධර්මය අවබෝධ කරගත හැකිවීම.

♦ ***රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති***
පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි
ලන්ඩන් බෞද්ධ විහාරය
London Buddhist Viharaya

නිවන

ශාන්ත නිවන් සැපත අර්හත්වයෙන් අවබෝධ කළද, පසේ බුදුවී හෝ ලොවිතුරා බුදුවී අවබෝධ කළද, එකම නිවනයි. වෙනසක් නැත. සෝවාන් වූ විට දකින්නේත්, සකෘදාගාමී වුවිට දකින්නේත්, අනාගාමී හෝ අර්හත් මාර්ගයේ ද දකින්නේත් එකම නිවනමයි. ඒ අමා මහ නිවන් සැපතේ ප්‍රභේද නැත. නමුත් එය අවබෝධ වන ආකාරයේ ප්‍රභේද හා වෙනසක් ඇත.

සෝවාන් වුවිට දකින්නේ විදුලිකොටන අවස්ථාවක ඒ විදුලි එළියෙන් රන් භාජනයක් දකින්නා වාගේ සාමාන්‍ය විදියටයි. සකෘදාගාමී වනවිට පහන් එළියෙන් භාජනයක් දකින්නා වාගේ ශාන්ත නිවන ඊට වඩා තරමක් පැහැදිලි වෙනවා. අනාගාමී වනවිට සඳ එළියෙන් යම් සේ පුද්ගලයින් හඳුනාගත හැකිද එලෙස පෙරට වඩා හොඳින් දැක ගත හැක. අර්හත්වයට පත්වන විට සූර්යාලෝකයෙන් භාජනය යම්සේ මනාව පැහැදිලිව පිරිසිදුව සුවිශුද්ධව දැකිය හැකිවේද එලෙස නිවන දත හැකි බව තථාගත ධර්මයෙහි සඳහන් වෙනවා.

පූජ්‍ය රිදියගම සුධර්මාභිවංශ හිමියන්ගේ
නිවන නම් කෘතිය ඇසුරෙනි.

NORMA & Co
Associate Solicitors

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

Colombo Office
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632